**ශීර්ෂය 268 - කිලිනොච්චිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

**-------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**---------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය

**------------------------------**

කිලිනොච්චිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කිලිනොච්චිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජූලි 31 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට කිලිනොච්චිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**-------------------------------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍යප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

-----------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1) (ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීමහෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන්කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම් ඉදිරිපත් කිරීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳව සැසඳුම් ප්‍රකාශය** | | |
| 2017 ජුලි 05 දිනැති අංක 256/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව විෂය අංක 26801 දරන රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය, 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රජයේ ගිණුම් 2019 පෙබරවාරි 28 දිනට ප්‍රථම විගණනයට ඉදිරිපත් කළ යුතු වුවත්, එය මාස 02 ක කාල ප්‍රමාදයකින් පසුව 2019 මැයි 15 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ සඳහන් කර ඇති විධිවිධානවලට අනුකූලව සැසඳුම් ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කළ යුතුය. | පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. |

### 1.6.2 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබිය යුතු වුවත්, එම අවශ්‍යතාවලින් බැහැර වී තිබූ අවස්ථා පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන චක්‍රලේඛයේ(iii) සටහන යටතේ වන බැඳීම් හා බැරකම්වල වාර්තා භාණ්ඩාගාරයේ එක් එක් වැය විෂයයක් සඳහා ඉදිරිපත් කර තිබූ බැඳීම් සහ බැරකම් ප්‍රකාශය සමඟ එකඟ විය | සුදුසු චක්‍රලේඛ විධිවිධින පැහැදිලිව සඳහන් කර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. | අදාළ වටිනාකම සටහන iv හි ඇතුළත් කර තිබූ නමුත් මූල්‍ය ප්‍රකාශනයේ III සටහනේ ඉහත රු.442,488 ක් වැරදීමකින් ඇතුළත් කර |

| | | | |
|---|---|---|---|
| | යුතුය. එසේ වුවත්, භාණ්ඩාගාරයේ බැරකම් ප්‍රකාශයේ ඇති රු.442,488 ක බැරකම් කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම් කාර්යාල මූල්‍ය ප්‍රකාශයේ හෙළිදරව් කර නොතිබුණි. මේ නිසා බැරකම් අඩුවෙන් දක්වා තිබුණි. | | නොතිබුණි. ඉදිරි කාලයේදී මෙවැනි වැරදි සිදුනොවීමට අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. |
| (ආ) | මුදල් රෙගුලාසි 106 සහ 113 යටතේ පාඩුවලින් අඛණ්ඩව අයකිරීමට, කපා හැරීමට, අත්හැරීමට ඇති පාඩු සම්බන්ධයෙන් වූ ප්‍රකාශනයේ රු.72,841,466 ක් වටිනා සිද්ධීන් 41 ක් සමාලෝචිත වර්ෂයේ පොත්වලින් කපා ඉවත්කර නොතිබූ නමුත් මූල්‍ය ප්‍රකාශනයේ සටහන (i) මහින් ගිණුම්වලට ගෙන නොතිබුණි. | ගිණුම්ගත කළ යුතු වටිනාකම් පිළිබඳව එක් එක් මූල්‍ය වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී පසුගිය වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ සැසඳීම් කළ යුතුය. | වැරදීමකින් ඇතුළත් කර නොතිබුණි. නමුත් ඊළඟ වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඉහත වටිනාකම ඇතුළත් කරනු ලබන බවට තහවුරු කරමි. |

### 1.6.3 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

#### (අ) මූලධන වියදම්

----------------

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ මූලධන වියදම් ගිණුම්ගත කිරීමේදී පහත දැක්වෙන අඩුපාඩු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ----------------------- | ------------- | --------------------------- |
| (i) | මිරිස් වගාව සඳහා ජලය ඉසීමේ උපකරණ මිලදී ගැනීම සඳහා රු.5,589,000 ක පිරිවැයකට ගිවිසුම් සඳහා එළැඹ තිබුණි. 2018 දෙසැම්බර් 31 දින කාර්යය අවසන් කළ බව සඳහන් කර චෙක්පත් ලියා තිබූ නමුත් රු.1,701,000 ක් වටිනා චෙක්පත් 02 ක් 2019 මැයි 13 දින වන විටත් කාර්යයන් අවසන් නොවීමෙන් අදාළ කොන්ත්‍රාත්කරුට ලබා දී නොතිබුණි. | කාර්යය අවසන් වීමෙන් පසුව පමණක් ගෙවීම් සිදුකළ යුතුය. | අදාළ සැපයුම්කරු විසින් භාණ්ඩ සපයා අදාළ ප්‍රතිලාභීන්ට ජලය ඉසීමේ උපකරණ සවිකර තිබූ නමුත් ඒ පිළිබඳ භාවිතා කිරීමේ පැහැදිලි කිරීම් ලබා නොදීම නිසා චෙක්පත් ලබා දී නොතිබුණි. දැන් ව්‍යාපෘතිය අවසන් කර ඇත. |
| (ii) | පූනාකරි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා වාහන නැවතුම්පොළ ඉදිකිරීමට රු. 2,357,425 ක පිරිවැයකට ගිවිසුම් සඳහා එළඹ තිබුණි. 2018 දෙසැම්බර් 31 දින මෙම කාර්යය අවසන් කළ බව සඳහන් කර චෙක්පතක් ලියා තිබූ නමුත් 2019 මාර්තු 15 දින වන විටත්, නිම කර නොතිබුණු නිසා රු.548,554 ක් වටිනා චෙක්පතක් 2019 මැයි 13 දින වන විටත් අදාළ කොන්ත්‍රාත්කරුට ලබා දී නොතිබුණි. | කාර්යය අවසන් වීමෙන් පසුව පමණක් ගෙවීම් සිදුකළ යුතුය. | කාර්යය නිම කර චෙක්පත් ලබා දී ඇත. |

| | | | |
|---|---|---|---|
| (iii) | පූනාකරි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා ආපන ශාලාවක් ඉදිකිරීම සඳහා රු. 4,681,811 ක පිරිවැයකට ගිවිසුම් සඳහා එළඹ තිබුණි. 2018 දෙසැම්බර් 31 දින මෙම කාර්යය අවසන් කළ බව සඳහන් කර චෙක්පතක් ලියා තිබූ නමුත් 2019 මාර්තු 15 දින වන විටත්, නිම කර නොතිබුණු නිසා රු.239,974 ක් වටිනා චෙක්පතක් 2019 මැයි 13 දින වන විටත් අදාළ කොන්ත්‍රාත්කරුට ලබා දී නොතිබුණි. | කාර්යය අවසන් වීමෙන් පසුව පමණක් ගෙවීම් සිදුකළ යුතුය. | කාර්යය නිම කර චෙක්පත් ලබා දී ඇත. |
| (iv) | කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සේවක සමූහ නේවාසිකාගාර ඉදිකිරීම සඳහා රු.17,597,100 ක පිරිවැයකට ගිවිසුම් සඳහා එළඹ තිබුණි. 2018 දෙසැම්බර් 31 දින මෙම කාර්යය අවසන් බව සඳහන් කරමින් චෙක්පත් 02 ක් ලියා තිබූ නමුත් 2019 මාර්තු 14 දින වන විටත් කාර්යය අවසන් කර නොතිබුණි. මේ නිසා රු.11,295,101 ක් වටිනා චෙක්පත් දෙක, 2019 මැයි 13 දින වන විටත් අදාළ කොන්ත්‍රාත්කරුට ලබා දී නොතිබුණි. | කාර්යය අවසන් වීමෙන් පසුව පමණක් ගෙවීම් සිදුකළ යුතුය. | ක්‍රියාමාර්ග ගෙන ඇත. |

**(ආ) තැන්පතු**

----------

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ තැන්පතු, ගෙවීම් සහ ශේෂ ගිණුම්ගත කිරීම්වලදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------ | ---------------- | ------------------------ |
| (i) | 2018 දෙසැම්බර් 31 දිනට තැන්පතු ගිණුම් ශේෂවල එකතුව රු.64,306,048 ක් ලෙස ද භාණ්ඩාගාර මුද්‍රිතවල පැවති ශේෂවල එකතුව රු.61,822,697 ක් ලෙස ද දක්වා තිබුණි. | ශේෂ සැසඳීම් කළ යුතුවේ. | පිළිතුරු ලබා දී නොමැත. |
| (ii) | කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල වර්ෂ 02 ක් ඉක්ම වූ එකතුව රු.1,575,494 ක තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ඉහත තැන්පතු සම්බන්ධයෙන් අදාල මුදල් රෙගුලාසි විධිවිධානවලට අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| (iii) | කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල වෙනත් අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු විසින් විවිධ කාර්යයන් සඳහා ලබා දී එකතුව රු.3,091,377 ක් වූ මුදල් අදාළ කාර්යයන් සඳහා භාවිතා නොකර තැන්පතු ගිණුම්වල රඳවාගෙන තිබුණි. | වෙනත් අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු විසින් ලබාදුන් මුදල් අදාළ කාර්යයන් අවසන් කිරීම සඳහා යොදා ගැනීමට කටයුතු කළ යුතුය. | අදාළ අරමුණු ඉටු වූ වහාම අදාළ තැන්පතු නිදහස් කරනු ලැබේ. |

**(ඇ) දේපල, පිරියත හා උපකරණ**

දේපල, පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත දැක්වෙන අඩුපාඩු හෙළිදරව් විය.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ස්ථාවර වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර ඇති ආරම්භක ශේෂවල ඇතුළත් වත්කම් වෙන වෙනම සමීක්ෂණය කළ හැකි ආකාරයට ලේඛන පවත්වාගෙන ගොස් නොතිබීම් නිසා කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් වත්කම් සියල්ල මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර ඇති බවට සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය. | ශේෂ තහවුරු කළ හැකි අයුරින් වෙන වෙනම ලේඛන පවත්වාගෙන යා යුතුය. | සිගාස් ගිණුම් ක්‍රමය මඟින් නිරවුල් කරමින් පවතී. ඉදිරි කාලවලදී වෙන වෙනම ලේඛන පවත්වාගෙන යාමට කටයුතු කර ඇත. |

**(ඇ) අත්තිකාරම් ගිණුම් ශේෂ**

අත්තිකාරම් ගිණුම්වලින් වර්ෂ අවසාන ශේෂ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩුව හෙළිදරව් විය.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව සේවය හැර ගිය, සේවයෙන් ඉවත් වූ සහ විශ්‍රාම ගිය නිලධාරීන්ගේ අයකිරීම් හිඟහිටව පැවතුණු ශේෂවල එකතුව රු.889,765 ක් වූ අතර එම ශේෂවලින් රු.644,195 ක් වර්ෂ 09 සිට වර්ෂ 15 කට අධික කාලයක සිට පැවත එන නමුත් මෙම හිඟ ශේෂ අයකිරීමේ ක්‍රියාමාර්ග මන්දගාමී තත්ත්වයේ පැවතුණි. | හිඟ ශේෂ අයකිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වීම. | පොත්වලින් කපාහැරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ආරම්භ කොට දැනට අවසන් අදියරේ පවතී. |

**(ඉ) අතුරු අග්‍රිම ශේෂ**

අතුරු අග්‍රිම ශේෂ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩුව අනාවරණය විය.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කළ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ (ACA-C) හෙළිදරව් කර ඇති මුළු ආදායම් නොවන ලැබීම් (Non-revenue receipt) රු.1,327,318,740 ක් ද අක් මුදල් අත්තිකාරම් (ACA-3) වශයෙන් ලැබීම් එකතුව රු.1,328,093,132 ක් වශයෙන් ද දක්වා තිබුණි. මේ නිසා රු.774,392 ක වෙනසක් නිරීක්ෂණය විය. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සියළුම ශේෂ සැසඳිය යුතුය. | භාණ්ඩාගාරයෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අක් මුදල් ලැබීම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට ලබාදෙනු ලැබේ. ප්‍රාදේශීය ලේකම් කාර්යාල මෙම අක් මුදලින් ගෙවීම් කිරිමෙන් අනතුරුව වර්ෂ අවසානයේ ඉතිරිව පවතින අක් මුදල් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ප්‍රේෂණය කරනු ලැබේ. මෙලෙස ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් ආපසු ලැබුණු අතුරු අග්‍රිම සඳහා ආපසු ලැබීම් මුදල් රු.566,892 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුළු ආදායම් නොවන ලැබීම්වල ඇතුළත් කර ඇත. |

**(ඊ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත සඳහන් ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය විය.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (i) ඇප ලේඛනය | | |
| මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව, ඇප තැබිය යුතු නිලධාරීන් සහ සේවකයන්ගේ තොරතුරු ඇතුළත් කොට ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 891(1) හි සඳහන් තොරතුරු ඇතුළත් ආකාරයෙන් ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳව ඇප ලේඛනයක් පවත්වාගෙන යා යුතුය. | ඇප ලේඛනයක් පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය. |

(ii) ආදායම් ලේඛන

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා නිලධාරීන්ගෙන් අයකළ කුලී සම්බන්ධයෙන් පරීක්ෂා කළ හැකි කිසිදු ලේඛනයක් පවත්වා නොතිබුණි. | කුලී අයකිරීම් පිළිබඳව ලේඛනයක් පවත්වා ගැනීමට කටයුතු කළ යුතුය. | නේවාසිකාගාර කුලී අයකිරීම් සම්බන්ධයෙන් ලේඛනයක් 2019 වර්ෂයේ සිට විධිමත්ව පවත්වාගෙන යනු ලැබේ. |

**(උ) විගණනය සඳහා සාක්ෂි නොවීම**

පහත සඳහන් ගනුදෙනු පිළිබඳ විගණන සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ (ACA-F) අක් මුදල් ශේෂ ලෙස රු.903,856,837 ක් හෙළිදරව් කර තිබූ නමුත්, මෙම අතුරු අග්‍රිමවලින් අනෙකුත් අමාත්‍යාංශවලට දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙනුවෙන් සලසා තිබුණු වියදම් ලෙස භාණ්ඩාගාර මුද්‍රිතවල BTBL – 31 සහ BTBL 67 ආකෘති මුද්‍රිතවල පිටපත් කිසිවක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | සියළුම වටිනාකම් එකඟ කළ හැකි අයුරින් ප්‍රකාශ ඉදිරිපත් කළ යුතුය. | භාණ්ඩාගාර මුද්‍රිතවල ආකෘති ඒ ඒ අමාත්‍යාංශ වෙනම භාණ්ඩාගාරයෙන් යවනු ලැබේ. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ අප දිස්ත්‍රික් ලේකම් කාර්යාල සිගාස් හි ලැබී ඇති වියදම් සාරාංශවල පවතින වටිනාකමට ඇතුළත් කර ඇත. |

**(ඌ) නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් අවස්ථා විශ්ලේෂණය කර පහත දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | විගණන නිරීක්ෂණ<br>අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| | රු. | | | |
| **භාණ්ඩාගාර චක්‍රලේඛ** | | | | |
| (i) 2015 ජුලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | 1,433,372 | අදාල කාර්යය අවසන් කර දින 10 ක් ඇතුළත ලබාගත් අතුරු අග්‍රිම නිරවුල් කළ යුතු වුවත් අවස්ථා 25 කදී ලබා දී තිබූ එකතුව රු.1,433,372 ක අතුරු අග්‍රිම දින 31 ක සිට දින 179 ක කාල ප්‍රමාදයකින් පසුව නිරවුල් කර තිබුණි. | අදාළ චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ඉදිරි කාලයේදී අදාළ මුදල් රෙගුලාසි, චක්‍රලේඛ අනුව නියමිත කාලය තුළ ආපසු ගෙවීම සහතික කරනු ලැබේ. |
| (ii) 2015 ජුලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | 5,891,651 | 2015 ජුලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය මගින් සංශෝධිත මුදල් රෙගුලාසි 371(5) අනුව කාර්යය අවසන් කර දින 10 ක් ඇතුළත ලබාගත් අතුරු අග්‍රිම නිරවුල් කළ යුතු වුවත් කරච්චි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් අවස්ථා 11 කට අදාළව එකතුව රු.5,891,651 ක් වූ අතුරු අග්‍රිම දින 37 සිට දින 143 ක කාල ප්‍රමාදයකින් පසුව නිරවුල් කර තිබුණි. | අදාළ චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ඉදිරි කාලයේදී අදාළ මුදල් රෙගුලාසි, චක්‍රලේඛ අනුව නියමිත කාලය තුළ ආපසු ගෙවීම සහතික කරනු ලැබේ. |

**(එ) වංචනික ස්වරූපයේ ගනුදෙනු**

නියැදි විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ වංචනික ස්වරූපයේ ගනුදෙනු පිළිබඳව විස්තර පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් සමෘද්ධි ප්‍රජා මූල බැංකුවේ 2017 අප්‍රේල් 07 දිනැති අංක 2017/5 දරන චක්‍රලේඛය අනුව එල්.පී.ගෑස් සිලින්ඩර් කොටසක් ලබාදීමේ වැඩසටහන යටතේ පූනාකරී සමෘද්ධි බැංකුව, කිලිනගර් සමෘද්ධි | ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | අදාළ නිලධාරීන්ගෙන් අයකිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. |

බැංකුව, වට්ටක්කච්චි සමෘද්ධි බැංකුව ආදියෙන් පිළිවෙලින් රු.63,270 ක්, රු.456,650 ක්, රු.142,274 ක් වටිනා එල්.පී.ගෑස් සිලින්ඩර් සහ ත්‍යාග වවුචර් ද සැපයුම්කරුවන්ගෙන් පරිත්‍යාග ලෙස ලැබී තිබුණි. මේවා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXXII පරිශ්ෂ්ඨයේ 2.1 වගන්තියට පටහැනි ආකාරයෙන් සමෘද්ධි නිලධාරීන් අතරේ බෙදාගෙන තිබුණි.

## 2. මෙහෙයුම් සමාලෝචනය
----------------------------

### 2.1 කාර්යභාරයන් ඉටු නොකිරීම
--------------------------------

| විගණන නිරීක්ෂණය<br>---------------------- | නිර්දේශය<br>-------------- | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>-------------------------------------- |
| --- | --- | --- |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ඒ යටතේ වන ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 විසින් 2018 දෙසැම්බර් 31 දින රු.44,794,141 ක් වටිනා චෙක්පත් 68 ක් කාර්යයන් අවසන් කළ බව සඳහන් කරමින් ලියා තිබුණි. එසේ වුවත්, අදාළ චෙක්පත් 2019 අප්‍රේල් 10 දින වන විටත් අදාළ පුද්ගලයන්ට ලබා නොදී අදාළ ලේකම් කාර්යාලවල තබා තිබූ අතර මුදල් රෙගුලාසි ප්‍රකාරව කිසිදු ඉදිරි ක්‍රියාමාර්ගයන් ද ගෙන නොතිබුණි. මේ නිසා රජයේ මුදල් ඵලදායී ආකාරයට උපයෝජනය කර නොතිබුණු අතර මුදල් රෙගුලාසි 137 හා 138 ට පටහැනිව ක්‍රියාකර තිබූ බව නිරීක්ෂණය විය. | අවසන් නොකළ කාර්යයන් සඳහා චෙක්පත් ලිවීමේ වැඩපිළිවෙල වළක්වා ගත යුතුය. | අවසන් නොවූ කාර්යයන් රු.520,873 ක් Arbitration සඳහා යොමුකර ඇත. රු.283,232 ක් ආදායමට මාරු කර ඇත. රු.1,258,269 ක් ලබාදීමට ක්‍රියාමාර්ග ගෙන ඇත.<br><br>**කණ්ඩාවලෙයි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය**<br>--------------------------------------<br>චෙක්පත් 08 ක් අදාළ අයට ලබා දී ඇත. චෙක්පත් 02 ක් ලබා දීම සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇත.<br><br>**පූනකරි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය**<br>--------------------------------------<br>සියළුම චෙක්පත් අදාළ අයට ලබාදී ඇත.<br><br>**පච්චිලෙයිපල්ලි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය**<br>--------------------------------------<br>චෙක්පත් 09 ක් අදාළ අයට ලබා දී ඇත. චෙක්පත් 03 ක් ලබා දීම සඳහා කටයුතු කර ඇත.<br><br>**කරච්චි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය**<br>--------------------------------<br>සියළුම චෙක්පත් අදාළ අයට ලබා දී ඇත. |

## 2.2 ප්‍රසම්පාදනයන්

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2017 මාර්තු 15 දිනැති දේශීය ප්‍රසම්පාදන නියෝජිත ආයතනයේ ප්‍රසම්පාදන මගපෙන්වීම්වල අතිරේකයේ අංක 31 හි ඡේද 4.2.3 අනුව ප්‍රසම්පාදන කාල සටහනෙහි සඳහන් ආකාරයට වැඩිම වශයෙන් සති 04 ක් ඇතුළත ලංසු මිල ගණන් අනිවාර්යයෙන් ඉදිරිපත් කිරීමේ කාල පරාසය සති 02 ක් ඇතුළත විය යුතුය. එසේ සඳහන් වුවත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වැඩසටහන් 21 ක් කාල ප්‍රමාදයක් සහිතව තීරණය කර පිළිගැනීමේ ලිපිය ලබා දී ගිවිසුම් අත්සන් කර තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කළ යුතුය. | ප්‍රසම්පාදන කමිටු සාමාජිකයන්ගේ කාර්යභාරයේ අධික බව සහ සාමාජිකයන්ගෙන් එක් අයෙකු වෙනත් දෙපාර්තමේන්තුවක සේවය කිරීම නිසා ප්‍රසම්පාදන කමිටු රැස්වීම්, පැවැත්වීමේ කාල ප්‍රමාදයන් සිදු වූ නිසා තීරණයන් ලබා දී පිළිගැනීමේ ලිපි ඉදිරිපත් කිරීමේ දී සිදුවන ප්‍රමාද වීම් හේතුවෙන් ද, නියමිත කාලය තුළ ගිවිසුම්වලට එළඹීමේ ප්‍රමාද වීම් සිදු විය. |
| (ආ) | රු.මිලියන 10 කට අඩු කාර්යයන් සඳහා ICTAD/SBD/03 භාවිතා කිරීමේදී CIDA ලියාපදිංචි මිල ගණන් වලංගු කාලය සම්පූර්ණයෙන් ක්‍රියාත්මක විය යුතුය. එසේම, තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් තීරණය ගනු ලැබීමේදී ආරම්භක අදියර තක්සේරුවේදී, CIDA ලියාපදිංචිය පරීක්ෂා කළ යුතු බවට සඳහන් වුවත්, CIDA ලියාපදිංචිය කල් ඉකුත් වූ, රු.2,958,364 ක් වටිනා කර්මාන්ත 02 ක් සඳහාත් CIDA ලියාපදිංචිය ඉදිරිපත් නොකළ රු.4,120,000 ක් වටිනා කර්මාන්ත 02 ක් සඳහාත් කොන්ත්‍රාත්කරුවන්ට කොන්ත්‍රාත් පිරිනමා තිබුණි. | ICTAD ලියාපදිංචි කළ බවට තහවුරු කරගත යුතුය. | තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් www.cida.gov.lk වෙබ් අඩවිය හරහා සෙවීමේදී අදාළ ලංසුකරුගේ CIDA පොත අලුත්කර දැක්වීම නිසාම, තක්සේරු කිරීමේදී කොන්ත්‍රාත්කරුගේ මිල ගණන් තක්සේරු කර කොන්ත්‍රාත් පිරිනමා තිබුණි. |
| (ඇ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.7 මාර්ගෝපදේශය ප්‍රකාරව ලංසු මිල ගණන්වල වලංගු කාලය තුළ කොන්ත්‍රාත් පිරිනැමීමේ අවසන් තීරණය ගනු ලැබීමත් සමඟම කොන්ත්‍රාත් පිරිනැමිය යුතු බව සඳහන් වුවත්, රු.4,550,000 ක් වටිනා වැඩසටහනක් ලංසු මිල ගණන් වලංගු කාලය ඉකුත් වූ පසුව දින 22 ක කාල ප්‍රමාදයක් සහිතව පිළිගැනීමේ ලිපිය යවා තිබූ අතර කොන්ත්‍රාත්තුව ලංසු ඇපකරය කල් ඉකුත් වූ පසුව ක්‍රියාත්මක කර තිබුණි. | ලංසු ඇපකරය වලංගු කාලය තුළම කොන්ත්‍රාත් ක්‍රියාත්මක කළ යුතුය. | ලංසු ලේඛන අපැහැදිලි නිසා ලංසු තීරණ පිළිබඳව ප්‍රසම්පාදන කමිටුව තුන් වතාවකටත් වඩා රැස් විය යුතුව තිබූ බැවින් කාල ප්‍රමාදයන් සිදුවිය. |

**2.3 රජයේ නිලධාරින්ගේ ඇප තැබීම්**

-----------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------ | ---------------- | ----------------------------- |
| (අ) | මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව ඇප මුදල් ගෙවිය යුතු සියළුම නිලධාරීන්ගෙන් ඇප මුදල් ලබාගෙන නොතිබුණි. | අදාළ නිලධාරීන්ගෙන් ඇප මුදල් අයකර ගත යුතුය. | ඇප මුදල් අයකර නොමැති නිලධාරීන්ගෙන් අයකිරීමට කටයුතු කර ඇත. |
| (ආ) | මුදල් රෙගුලාසි 881 (i) ප්‍රකාරව ඇප මුදල් ගෙවිය යුතු තනතුරකට පත්කරනු ලබන නිලධාරියෙකු පත්වීම් දින සිට හෝ තනතුර සඳහා මාරු කරනු ලැබූ දින සිට මාස 02 ක් ඇතුළත් ඇප මුදල් ගෙවිය යුතුය. මාස 03 ක් ඇතුළත අවශ්‍ය ඇප මුදල් ගෙවීම පැහැර හැරීමේදී නිලධාරියාගේ වැටුප් අත්හිටවිය යුතු බව සඳහන් වුවත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | මුදල් රෙගුලාසි 881 (i) අනුගමනය කළ යුතු වේ. | ඇප මුදල් ලබාගැනීමට කටයුතු කර ඇත. |
| (ඇ) | මුදල් රෙගුලාසි 881(ii) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානීන් ඇප මුදල් ගෙවිය යුතු තම යටත් නිලධාරීන් කිසියම් කාල පරාසයක් තුළ ඒවා ගෙවීම සහතික කිරිම කළ යුතු බව සඳහන් වුවත් මේ පිළිබඳව කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | මුදල් රෙගුලාසි 881 (ii) අනුගමනය කළ යුතු වේ. | ක්‍රියාමාර්ග ගෙන ඇත. |

**2.4 පාඩු හා හානි**

--------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ------------------------ | ---------------- | ------------------------ |
| අනතුරුවලින් වාහන 05 කට සිදු වූ පාඩු සඳහා රක්ෂණය මඟින් ආවරණය කරගත් වටිනාකම හැර ඉතිරි රු.1,621,201 ක පාඩු වර්ෂ 01 සිට වර්ෂ 07 කට අධික කාලයක් දක්වා ගිණුම්ගත කර නොතිබුණි. | අනතුරුවලින් සිදු වූ පාඩු ගිණුම්වල හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුය. | ඉදිරි වර්ෂයේදී ගිණුම් වාර්තාවල ඇතුළත් කිරීමට කටයුතු කෙරේ. |

## 2.5 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ විගණකාධිපති වාර්තාවේ ඇතුළත් කර තිබූ විගණන ඡේදවලින් පසු විපරම් කටයුතු සම්පූර්ණ නොකළ ඡේදවලට සම්බන්ධ කරුණු පහත දැක්වේ. | | | |
| (i) | කන්දාවලෙයි ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරිම් කාර්යයන් සම්පූර්ණ කර නොතිබුණි. | ඉදිකිරීම් කාර්යයන් අවසන් කළ යුතුය. | කන්දාවලෙයි ගොඩනැගිලි ඉදිකිරීම් කාර්යයන් අවසන් අදියරේ පවතී. |
| (ii) | කොන්ත්‍රාත් කාර්යයන්වලට අදාළ වැඩිපුර ගෙවන ලද ගෙවීම්වල එකතුව රු.686,492 ක් පිළිබඳව කටයුතු කර නොතිබුණි. | වැඩිපුර ගෙවීම් අයකර ගත යුතුයි. | සෝරන්පත්තු මාර්ගය සඳහා වැඩිපුර ගෙවීම් ඇප මුදලින් අයකර ගෙන තිබුණි. සිත්තප්පා කඩෙයි මාර්ගය ව්‍යාපෘතියට අදාළ වැඩිපුර ගෙවීම් රු.2,221,619 ක් ඇප මුදලින් අයකරගෙන තිබුණි. ඉතිරි මුදල් නිරවුල් කරන ලෙසට ලිපි යවා ඇත. |
| (iii) | 2014 අප්‍රේල් 08 දින අවසන් වූ පාර්ලිමේන්තු ගිණුම් කාරක සභා කමිටුවේ අණට අනුකූලව මේ දක්වා රු.මිලියන 4.225 ක නොවිසඳු වී මිලදී ගැනීම් අත්තිකාරම් සම්පූර්ණයෙන් අයකර ගෙන නොතිබුණි. | අත්තිකාරම් නිරවුල් කළ යුතුය. | දැනට හිඟ හිටව රු.4,125,000 ක් පවතී. මාසික වාරික පදනමින් අයකරගැනීම් සිදු කරමින් පවතී. |
| (iv) | මාසාර් කොල්ලක්කුරිච්චි ලවණ ජලය නවතාලීමේ ව්‍යාපෘති වටිනාකම රු.1,554,000 ක් සම්පූර්ණ කර නොතිබුණි. | ව්‍යාපෘතිය සම්පූර්ණ කළ යුතුය. | මාසාර් ව්‍යාපෘතියේ අවසන් කළ වැඩවලට පමණක් ගෙවීම් සිදුකරන බව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තීරණය මත චෙක්පත් ලියන ලදී. එසේ වුවත්, සම්පූර්ණයෙන්ම අවසන් කළ බවට වාර්තා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට නොලැබීමෙන් චෙක්පත් ආදායම් ගිණුමට මාරු කර ඇත. |

| | | | |
|---|---|---|---|
| (v) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් කන්දාවලෙයි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා 2017 වර්ෂයේදී ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට ලබා දී තිබූ රු.මිලියන 20 ක ව්‍යාපෘතිය මේ දක්වා සම්පූර්ණ කර නොතිබුණි. | ව්‍යාපෘතිය සම්පූර්ණ කළ යුතුය. | කන්දාවලෙයි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගොඩනැගිලි ඉදිකිරීම් කාර්යයන් ක්‍රියාත්මක වෙමින් පවතී. ඉතා ඉක්මනින් මහජනතාවගේ භාවිතය සඳහා භාරදෙනු ලැබේ. |
| (vi) | කන්දාවලෙයි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වාහනය 2017 ජුනි 16 දින අනතුරට ලක්වීම සම්බන්ධයෙන් රු. 1,348,904 ක් වැය වී තිබුණි. මේ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව මේ දක්වා කටයුතු සම්පූර්ණ කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. | විමර්ශන කමිටුව පත්කර ඇත. විමර්ශන වාර්තා ලබාගත් විගස ඉදිරි කටයුතු සිදු කෙරේ. |
| (vii) | සේවක ණය අයකිරීම් හිඟ රු.517,803 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අයකර ගත යුතු වේ. | කපා හැරීම සඳහා රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු අමාත්‍යාංශයට ඉල්ලීම් යවා ඇත. |
| (viii) | සේවකයින්ට පුහුණුව ලබාදීම සඳහා වෙන්කර තිබූ ප්‍රතිපාදනවලින් රු.168,408 ක් හෙවත් සියයට 15 ක් උපයෝජනය කර නෙතිබුණි. | පුහුණු පන්ති පිළිබඳ වූ ප්‍රතිපාදන විධිමත්ව ක්‍රියාත්මක කර සම්පූර්ණයෙන් උපයෝජනය කළ යුතුය. | වර්ෂ අවසානයේ පුහුණු පන්ති පැවැත්වීමට සැලැසුම් කර තිබූ නමුත්, කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ඇති වූ දරුණු ගංවතුර හේතුවෙන් පුහුණු පන්ති පැවැත්වීමට නොහැකි වූ බැවින් රු.168,408 ක් උපයෝජනය කළ නොහැකි තත්ත්වයක් මතු විය. |
| (ix) | සමාලෝචිත වර්ෂය සඳහා පුනරාවර්තන වියදමින් වැය විෂයයන් 1003, 1403, 1203 න් පිළිවෙලින් රු.7,379,051 ක් රු.102,955 ක් රු.25,000 ක් උපයෝජනය කර නොතිබුණි. මෙය ශුද්ධ ප්‍රතිපාදනයෙන් පිළිවෙලින් සියයට 14, 9, 11 ක් වී තිබුණි. | ප්‍රතිපාදන සම්පූර්ණයෙන් උපයෝජනය කළ යුතුය. | 1003 - ඇතැම් සේවකයන් වැටුප් රහිත නිවාඩු දින සහ අඩ වැටුප් නිවාඩු දින ලබාගත් නිසා මෙය අමතරව සිදු වූවකි. මෙය අමතරව 1403 - සේවකයන් දුම්රිය බලපත්‍ර අපේක්ෂි කළ පරිදි උපයෝජනය කර නොතිබුණි. 1203 - කාර්යාල සේවකයන්ගේ ශ්‍රේණියේ සිදු වූ වෙනස්වීම් සහ කාර්යාල සේවකයන් දෙදෙනෙකු විශ්‍රාම ගෙන ඇත. |

**3. මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අනුමත සේවක සංඛ්‍යාව 533 ක් ද, තථ්‍ය සේවක සංඛ්‍යාව 469 ක් ද වූ අතර සේවකයන් 69 දෙනෙකුගේ පුරප්පාඩු ද සේවකයන් 05 දෙනෙකුගේ අතිරික්තයක් ද පැවතුණි. | පුරප්පාඩුව පවතින අත්‍යාවශ්‍ය තනතුරු සඳහා සේවකයන් බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. | ඉල්ලීම් ලිපි යවා ඇති අතර, අදාල අමාත්‍යාංශ සමඟ සාකච්ඡා කොට ඇත. |
| (ආ) | කන්දාවලෙයි ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා ප්‍රාදේශීය ලේකම් තනතුර සහ පරිපාලන නිලධාරීන් 05 දෙනෙකුගේ තනතුරු සඳහා බඳවා ගැනීම් කර නොතිබුණි. | පුරප්පාඩුව පවතින අත්‍යාවශ්‍ය තනතුරු සඳහා සේවකයන් බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. | ඉල්ලීම් ලිපි යවා ඇති අතර, අදාල අමාත්‍යාංශ සමඟ සාකච්ඡා කොට ඇත. |